රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2021

මගේ අංකය : EST-3/POLIC/04/0036
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.06.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල දී ජයග්‍රහණය කර එම ආයතනවල නගරාධිපති/ සභාපති, නියෝජ්‍ය නගරාධිපති/උප සභාපති/ නාගරික මන්ත්‍රීවරුන්/ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන් වෙත ලබා දී ඇති රාජකාරි නිවාඩු සංශෝධනය</u>**

ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:4 උප වගන්තිය සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2007.05.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2007 හා 2008.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(III) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2007න් සංශෝධිත ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:4 උප වගන්තිය අනුව පළාත් පාලන ආයතනයක සභිකයකු/උප සභාපතිවරයෙකු සඳහා දැනට ලබා දෙන වැටුප් සහිත නිවාඩු දින 05 දින 06ක් ලෙස සංශෝධනය කිරීමට සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(III)හි විධිවිධානය අනුව පළාත් පාලන ආයතනයක සභාපතිවරයකු සඳහා දැනට ලබා දෙන වැටුප් සහිත නිවාඩු දින 07 දින 08ක් ලෙස සංශෝධනය කිරීමටත් 2021.05.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව, ඉහත පරිදි ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:4 උප වගන්තිය සංශෝධනය කර, එකී උප වගන්තියට ඉනික්බිතිවම 2:3:5 ලෙස නව උපවගන්තියක් ඇතුළත් කර පහත පරිදි ආයතන සංග්‍රහය සංශෝධනය කෙරේ.

"2:3:4 පළාත් පාලන ආයතනයක නියෝජ්‍ය නගරාධිපතිවරයකු/උප සභාපතිවරයකු, නාගරික මන්ත්‍රීවරයකු/ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ලෙස පත්වන දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයෙකුට ඔහු දරමින් සිටි තනතුරෙහි සිටියදී ම පළාත් පාලන ආයතනයේ රැස්වීම්වලට සහභාගීවීම සඳහා හා එම රැස්වීම් හා අනුබද්ධිත කාර්යයන්හි නිරතවීම සඳහා සේවයේ හදිසි අවශ්‍යතාවන්ට යටත්ව මසකට දින 06ක් වැටුප් සහිත නිවාඩු ඔහුට ලබාදිය යුතුය."

"2:3:5 පළාත් පාලන ආයතනවල නගරාධිපති/සභාපති තනතුරට පත්ව ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන්ට පළාත් පාලන ආයතනයේ කටයුතුවල නිරතවීම සඳහා මසකට දින 08ක් රාජකාරි නිවාඩු ලබා දී නිලධරයාට නිත්‍ය තනතුරෙහි සේවයේ යෙදීමට අවස්ථාව ලබාදීම

හෝ

ඉහත සඳහන් නිවාඩු ලබා ගැනීමට මනාපය පළ නොකරන නිලධරයකු පළාත් පාලන ආයතනයක නගරාධිපති/ සභාපති තනතුරට පත්වුවහොත් හෝ එවන් තනතුරක වැඩ බැලීමට

පත්වුවහොත් හෝ එම තනතුර දැරීමට නියමිත සම්පූර්ණ කාලයම වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට මනාපය පළ කර ඇති නිලධරයන්ගේ එම තනතුර දැරීමට නියමිත කාලය පිළිබඳව පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා විසින් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත අදාළ දින වකවානු සහිතව වහාම දැන්විය යුතු අතර අදාළ නිලධරයා විසින් ද තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත වෙනම දැන්වීම කළ යුතු ය. එවන් වාර්තාවක් ලද විට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිලධරයාව අදාළ සම්පූර්ණ කාලයම වැටුප් රහිත නිවාඩු තත්ත්වයේ තැබිය යුතු ය."

04. මෙම විධිවිධාන 2021.05.03 දින සිට බලාත්මක වේ.



ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා,පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය